


- **ගැබ්ගෙල පිළිකා බොහෝ දුරට ගැබ්ගෙල ආශ්‍රිතව HPV ආසාදනය දිගුකල් පැවතීම මගින් ඇතිවිය හැක.**
- **ගැබ්ගෙල පිළිකාව ඇතිවීමට පෙර පූර්ව පිළිකා අවධියක් ඇත.**
- **පූර්ව පිළිකා අවධියේ දී රෝග ලක්ෂණ නොමැත.**

## ගැබ්ගෙල පිළිකාවක මූලික රෝග ලක්ෂණ මොනවාද?

- යෝනි මාර්ගයෙන් අක්‍රමවත් රුධිර වහනය
- ලිංගික සංසර්ගයට පසු රුධිර වහනය
- යෝනි මාර්ගයෙන් අධික දුර්ගන්ධයකින් යුත් ශ්‍රාවයක් පිටවීම
- මාස් ශුද්ධිය නැවතී ඇති කාන්තාවන්ගේ යෝනි මාර්ගයෙන් රුධිරය පිටවීම.

**(මෙම රෝග ලක්ෂණ පිළිකාවක් නොවන වෙනත් රෝග තත්ත්වවලදී, ද ඇතිවිය හැක.)**

## ගැබ්ගෙල පිළිකාවක අවදානම වැඩි කාටද?

- හියුමන් පැපිලෝමා (HPV) නමැති වෛරසය ආසාදිත කාන්තාවන්ට
- අඩු වයසින් ලිංගික ජීවිතය ඇරඹූ කාන්තාවන්ට
- බහුපුරුෂ සේවනයේ යෙදෙන කාන්තාවන්ට
- බහුස්ත්‍රී සේවනයේ යෙදෙන පුරුෂයන් සමග ලිංගිකව සම්බන්ධවන කාන්තාවන්ට
- අක්‍රියව හෝ සක්‍රියව දුම්පානයේ යෙදෙන කාන්තාවන්ට
- විවිධ රෝග සඳහා ප්‍රතිශක්තීකරණය හීනකරවන බෙහෙත් ගන්නා කාන්තාවන්ට
- ලිංගිකව බෝවන රෝග සෑදී ඇති කාන්තාවන්ට

## ගැබ්ගෙල පිළිකාවක් සෑදීමේ අවදානමක සිටින බව කලින් දැනගත හැකි ද?

### ගැබ්ගෙල පිළිකාව සෑදීමට පෙර (පූර්ව පිළිකා අවධිය) පැප් පරීක්ෂාවකින් හඳුනාගත හැකිය.

- පැප් පරීක්ෂාවක් යනු ගැබ්ගෙල ආශ්‍රිතව සිදු කරන සරල පරීක්ෂණයකි.
- මේ සඳහා ඔබ පැමිණිය යුතු වන්නේ මාසික ශුද්ධ වීම නොමැති දිනයක දී ය.
- මෙහි දී ඔබට වේදනාවක් හෝ අපහසුතාවක් ඇති නොවේ.
- මෙමගින් ගැබ්ගෙලෙහි පූර්ව පිළිකා සෛල හඳුනාගත හැකි වේ.

## පැප් පරීක්ෂණයට යොමු විය යුත්තේ කවුද?

- පැප් පරීක්ෂණය නිරෝගී කාන්තාවන් වෙනුවෙනි.
- මෙම පරීක්ෂණය අවුරුදු 35 හෝ ඊට වැඩි විවාහක කාන්තාවන්ට සුවනාරි සායනවල දී කර ගත හැකිය.
- මෙයට අමතරව ලිංගික සම්බන්ධතා පවත්වන සියලු කාන්තාවන් සඳහා ප්‍රථම ලිංගික එක්වීමෙන් වසර 5 කට පසු මෙය නිර්දේශ කෙරේ.